# පුංචි වොනාරා



වොනාරා තෙන්නකෝන්

පළමු දිගහැරීම

| | |
|---|---|
| පාසල | මහනුවර මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පංතිය | 2 ශ්‍රේණිය A |
| කෘතිය පළකරන දිනය | 2026.05.10 |

# පිදුම

මාගේ ප්‍රථම දිගහැරුම වන පුංචි වොනාරා පොත් පිංච එළිදැක්වීම වෙනුවෙන් මා හට සියලු කටයුතු සලසාදුන් මාගේ ආදරණීය අම්මාටත් , අප්පච්චිටත් ,අයියාටත් වගේම මගේ හැම දැග වැඩකට ම සහයෝගය ලබාදෙන අත්තම්මාටත්, මාගේ ආදරණීය පංතිභාර ගුරුතුමිය වන ගයත්‍රි සෙනෙවිරත්න ගුරුමෑණියන්ටත් මෙම අවස්ථාව ලබාදුන් හේමමාලා උපහාර vග්‍රන්ථකරණ ව්‍යාපෘති නිර්මාතෘ සෙනෙවිරත්න මහලේකම් ගුරුපියාණන්ටත් මාගේ පාසලේ විදුහල්පතිනිය වන ශශිකලා සේනාධීර ගුරුමෑණියන්ටත් ස්තූතිවන්ත වෙමින් මාගේ ප්‍රථම දිගහැරුම මෙසේ පුද කරමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්‍ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්‍ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්‍ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්‍ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්‍ය ,<br>
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.


2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

මගේ ලෝකේ හරි පුංචිද කියලා කවුරුහරි ඇහුවොත්, මම කියන්නේ “නෑ… මගේ ලෝකේ හරිම ලොකුයි” කියලා.



මගේ ලෝකේ තියෙන්නේ ගෙවත්තේ ගස්, මල්, සත්තු, අත්තම්මිගේ ආදරේ, අම්මි , අප්පච්චිගේ හිනාව, අයියාගේ සෙල්ලම්.



උදේ පාන්දරම මම වත්තට දිව්වාම, කුරුල්ලන්ගේ සද්ද ඇහෙද්දි හිත හරිම සතුටුයි.පූසි චුංගියා මගේ පස්සෙන්ම එනවා. “ආයෙත් මට යාළුවෝ හම්බවෙයිද අද?” කියලා මම අහනවා. ඒකට පිළිතුර දෙනවා වගේ ගස් අතු හෙමින් හෙමින් සෙලවෙනවා.



එදා වැහි දවසක්,වත්තේ කොනක පුංචි හූනෙක් තනියම හිටියා. කවුරුත් බයවෙද්දි, මම හෙමින් එයා ළඟට ගියා. “බය වෙන්න එපා යාළු, මං ඔයාගේ යාළුවා” කියලා කුඩා හඬකින් කිව්වා. ඒ මොහොතේ මට තේරුණා ආදරේ කියන්නේ බය නැතිකම කියලා.

අත්තම්මි මාව බලලා හිනා වුණා. “සත්තුන්ට ආදරේ තියෙන දරුවෙක්ගෙ හිතත් ලස්සන වෙනවා” කියලා අත්තම්මි කිව්වා. ඒ වචන මගේ හිතට තදින් වැටුණා.



හවස බයිසිකලේ පදිද්දි, හුළඟත් එක්ක මගේ හිනාව වත්ත පුරා පැතිරුණා. එදා දවස ඉවර වෙද්දි, මම දැනගත්තා ලෝකේ ලස්සන වෙන්නේ ගොඩක් ලොකු දේවල් වලින් නෙවෙයි, පුංචි හිතක තියෙන ලොකු ආදරේකින් කියලා.

ඒ නිසාම මගේ හිතේ, හැම දවසක්ම අලුත් සතුටක් ඉපදුණා.මගේ සිනාවෙන් ගෙවත්ත ලස්සන වුණා, සත්තුන්ටත් ආරක්ෂාවක් ලැබුණා.
පුංචි හිතක ඉපදුණ ඒ මහත් ආදරය, හෙට දවසේ ලෝකයත් ලස්සන කරනවා කියලා කවුරුත් දැනගත්තා.

රෑ වෙද්දි අත්තම්මිගේ උණුසුමේ අත අල්ලගෙන මම නිදාගත්තේ, අද හම්බවුණ යාළුවන් ගැන හීන දකිමින්.සිහින ලෝකෙත් මට සත්තු කතා කරනවා, කුරුල්ලෝ සිංදු කියනවා, ගස් මල් වගේ හිනාවෙනවා.



ඒ හීන අතරින් මම හුරු වුණේ එකම පාඩමකට ඒ ආදරෙන් ජීවත් වෙන කෙනෙක් ලෝකේ කවදාවත් තනි වෙන්නේ නෑ.



# වොනාරා තෙන්නකෝන්

## පළමු දිගහැරීම



| | |
|---|---|
| පාසල | මහනුවර මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පංතිය | 2 ශ්‍රේණිය A |
| කෘතිය පළකරන දිනය | 2026.05.10 |

**ISBN 978-624-208-936-2**

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර V** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ

යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)